// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2339/38 – 2023 ජූලි මස 08 වැනි සෙනසුරාදා – 2023.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2015 දෙසැම්බර් මස 15 වැනි දින අංක 1945/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 231 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/328.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාගේ අංකය: WGSWD&EIP/ACQ/KB/18.
2023 මැයි මස 24 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝවිල, වේරහැර කටුවාවල, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2012/1096 හා 2013.10.04 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 28 – කොට්ටේ මහපිල්ලෑව – ප්‍රමාණය: හෙක්. 0.0152**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 29 සහ 3; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 3 සහ 27; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 27; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 25 සහ 29.

EOG 07- 0038

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 දෙසැම්බර් මස 08 දින අංක 1996/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 295 දරන

1A – G039832 – 24(2023/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2016/LRB/195.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාගේ අංකය: WGSWD&EIP/ACQ/KB/36.
2023 ජූනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535, පැපිලියාන බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැපිලියාන (බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/KSB/2021/623 හා 2022.09.23 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'M' – වරිපනම් අංකය සොයාගත නොහැක රණසිංහ මාවත – ප්‍රමාණය: හෙක්. 0.0013**

උතුරට: අඩිපාර සහ කැබලි අක්ෂර N; නැගෙනහිරට: කැබලි අංක N, රණසිංහ මාවතේ වරිපනම් අංක 465/24 ඒ දරණ ඉඩම සහ රණසිංහ මාවතේ වරිපනම් අංකය සොයාගත නොහැකි සී. එම්. බ්‍රාක්මණ හිමිකම් කියන ඉඩම; දකුණට: රණසිංහ මාවතේ වරිපනම් අංකය සොයාගත නොහැකි සී. එම්. බ්‍රාක්මණ හිමිකම් කියන ඉඩම සහ අඩිපාර; බටහිරට: අඩිපාර.

EOG 07- 0039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.